# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1976/22 - 2016 ජූලි මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2016.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාතේ, පළාත් සභාවේ 2016 අංක 01 දරන ඌව පළාතේ, සමූපකාර සේවක කොමිෂන් සභා (සංශෝධිත) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2016.06.09 වැනි දින සම්මත කරන ලදුව 2016 ජුනි දහසය වැනි දින ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

ආර්. ඒ. එච්. ඒ. සමරසිංහ,
ලේකම්,
ඌව පළාතේ පළාත් සභාව.

2016 ජූලි මස 14 වැනි දින,
බදුල්ල රජ වීදියේ පිහිටි,
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව පළාතේ පළාත් සභාව**

2016 අංක 1 දරන ඌව පළාත් සභාවේ ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා (සංශෝධන) ප්‍රඥප්තිය

2010 අංක 04 දරන ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා පනවනු ලබන ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් පළාත් සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1A - PG 3026 — 17 (2016/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

01. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවේ 2016 අංක 1 දරන ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර අන්‍යාකාරයකින් සඳහන් කර ඇත්නම් මිස එය ඌව පළාතේ ආණ්ඩුකාරයා විසින් අනුමත කරන ලද දින සිට හෝ තීරණය කරන ලද දින සිට සියලු කාර්යයන් සඳහා බලාත්මක විය යුතු බව ද සලකනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

02. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් හඳුන්වනු ලබන) 2010 අංක 04 දරන ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) සහ (3) උපවගන්ති ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දක්වෙන අළුත් උප වගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

කොමිෂන් සභාවේ සංයුතිය

(1) කොමිෂන් සභාව මෙහි මින් මතු ''අමාත්‍යවරයා'' ලෙස හඳුන්වනු ලබන ඌව පළාත් සමූපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(3) සමූපකාර සේවක කොමිෂන් සභාවට පත් කරනු ලබන සාමාජිකයින් අතරින් තිදෙනෙකු රාජ්‍ය සේවයේ විශ්‍රාම ලැබූ මාණ්ඩලික මට්ටමේ තනතුරු දරූ නිලධාරීන් විය යුතු ය. එසේම එක් අයෙකු සමූපකාර ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් ඇති අයෙකු විය යුත්තේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

03. 2010 අංක 04 දරන ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (2), (3) හා (4) උප වගන්ති ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) කොමිෂන් සභා රැස්වීම් වල සණ පූර්ණය සඳහා එහි සාමාජිකයින් තිදෙනෙකු පැමිණ සිටීම ප්‍රමාණවත් වේ.

(3) සාමාජිකයින් සිව් දෙනෙකු පැමිණ සිටින අවස්ථාවකදී යම් කරුණක් පිළිබඳව තීරණයක් ගත නොහැකි වූ විටක එම කරුණ කොමිෂන් සභාවේ සාමාජිකයින් පස් දෙනාම පැමිණ සිටින රැස්වීමට ඉදිරිපත් කළ යුතු ය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයින් පස් දෙනාම පැමිණ සිටින රැස්වීමකදී යම් කරුණක් පිළිබඳව ගත යුතු තීරණය සම්බන්ධයෙන් ඒ සාමාජිකයින් අතර වන මතය වෙනස් වන්නේ නම් වැඩි දෙනාගේ මතයට අනුව තීරණයකට එළඹිය යුතු ය. එහෙත් සාමාජිකයින් සමානව බෙදුනහොත් සභාපතිවරයාට තීරක ඡන්දයක් හිමි වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය

04. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

08 - 98

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.